# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2145/49 - 2019 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු,
29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග

2017 නොවැම්බර් 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2045/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ නිකුත් කළ 2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගයේ IV වන උපලේඛනයේ ''ඊ'' ශීර්ෂය යටතේ වූ භාණ්ඩ අපනයනකරුවන් විසින් භාණ්ඩ අපනයන කිරීම මඟින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත නැවත රැගෙන ඒම පිළිබඳ වූ නියෝගය මෙයින් ඉවත් කරන අතර එය පහත පරිදි ආදේශ කරනු ලැබේ.

1. සෑම භාණ්ඩ අපනයනකරුවෙකු විසින්ම භාණ්ඩ අපනයන කිරීම මගින් ලද මුදල් එම අපනයන සිදු කළ දිනයේ සිට දින 180 ක් තුළ ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලැබිය යුතු ය.

2. සෑම භාණ්ඩ අපනයනකරුවකු විසින්ම එක් එක් අපනයනය සම්බන්ධයෙන් අදාළ ලිඛිත සාක්ෂි, ගෙවීම ලබාගන්නා බලයලත් වෙළෙන්දා වෙත හෝ පරිසීමිත වෙළෙන්දා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. මෙම ''ඊ'' ශීර්ෂයේ අවශ්‍යතාවට අදාළව භාණ්ඩ අපනයනකරුවන් දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වාදීමට සහ ඊට අනුකූල නොවන අවස්ථා සම්බන්ධව නිසි පියවර ගැනීම පිළිබඳ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වෙයි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

11 - 155

1A - PG 4712 — 542 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*